# වන අලින්ගෙන් කුඹුරු රැකදෙන ආරක්ෂිත විදුලි වැටක්

අලි-මිනිස් ගැටුම පාලනය සඳහා කුඹුරුයාය වටා කාලීන විදුලි වැට ඉදිකිරීමේ
ව්‍යාපෘති භාර ව කටයුතු කරන නිලධාරීන් සඳහා අත්වැලක්



සංරක්ෂණ පර්යේෂණ ආයතනය

# වන අලින්ගෙන් කුඹුරු රැකදෙන ආරක්ෂිත විදුලි වැටක්

අලි-මිනිස් ගැටුම පාලනය සඳහා
කුඹුරුයාය වටා කාලීන විදුලි වැට ඉදිකිරීමේ ව්‍යාපෘති
භාර ව කටයුතු කරන නිලධාරීන් සඳහා අත්වැලක්

**සංරක්ෂණ පර්යේෂණ ආයතනය**

# වන අලින්ගෙන් කුඹුරු රැකදෙන ආරක්ෂිත විදුලි වැටක්

පළමු මුද්‍රණය : 2017 මාර්තු

පිටපත : ආචාර්ය පෘථිවිරාජ් ප්‍රනාන්දු
සම්පත් ඒකනායක
සුපුන් ළහිරු ප්‍රකාශ්


| | |
|---|---|
| කවර නිර්මාණය හා පිටු සැකසුම | : ධම්මික මනෝජ් (DM Creations) |
| සෝදුපත් බැලීම | : ශාලික විමලසේන |
| මුද්‍රණය | : සිත්රෑ ග්‍රැෆික්ස් |
| ප්‍රකාශනය | : සංරක්ෂණ පර්යේෂණ ආයතනය,<br>අංක 26/7, C2 පාර, කොඩිගහවැව,<br>ජුල්පල්ලම,<br>තිස්සමහාරාමය |

# හැඳින්වීම

අලි-මිනිස් ගැටුම, එසේත් නැතිනම් වන අලින් විසින් මිනිසුන්ගේ බවභෝග, ගේදොර, හා ජීවිත විනාශ කිරීම දිනෙන් දින ම උග්‍ර වන සමාජ, ආර්ථික හා පාරිසරික ප්‍රශ්නයක් බවට පත්වෙමින් පවතී. ඊට විසඳුම් සෙවීමට විවිධ පාර්ශ්ව නොයෙකුත් ආකාරයෙන් උත්සාහ දැරුවද මේ දක්වා ඒ විසඳුම් යෝජනා සැලකිය යුතු සාර්ථකත්වයක් අත්කරගෙන නැත.

අලි-මිනිස් ගැටුම පාලනය කර මිනිස් ජීවිත හා දේපොළ ආරක්ෂා කර ගැනීමට යොදා ගත හැකි හොඳම විසඳුමක් ලෙස විදුලි වැට හැඳින්විය හැකිය. රුපියල් කෝටි ගණනක් මහජන මුදල් වියදම් කරමින් විදුලි වැට ඉදිකර අලි-මිනිස් ගැටුම පිටු දැකීමට උත්සාහ දැරුණේ එබැවිනි. නමුත් දිවයින පුරා විවිධ ප්‍රදේශ වල ඉදිකළ විදුලි වැටවල් බොහොමයක් අපේක්ෂිත සාර්ථක ප්‍රතිලාභ අත්කර දී නොමැත. විදුලි වැට බිඳගෙන ගම් වදින අලි ඇත්තු බාධාවකින් තොරව යළි යළිත් මිනිසුන්ගේ ජීවිත වලට තර්ජන එල්ල කරමින්, ජන ජීවිත අඩාල කරමින් සිටිති. මෙම ගැටුම නිසා වසරකට මිනිස් ජීවිත හැත්තෑවක් පමණ අපට අහිමි වෙයි. ඒ මිනිස් ජීවිතවල වටිනාකම අපට මිල කළ නොහැක. එසේ ම මිනිසුන්ගේ නිවාස, යටිතල පහසුකම්, හා බවභෝග විනාශ වීම නිසා වාර්ෂික ව විශාල ආර්ථික හානියක් සිදු වේ. මෙම ගැටුමේ අනෙක් පාර්ශ්වය වන අලි-ඇතුන් ද ඉන් ඉමහත් පීඩාවට පත්වන අතර, වාර්ෂික ව සද්දන්තයෝ දෙසිය පනහක් පමණ අලි-මිනිස් ගැටුමට බිලි වෙති.

නමුත් පර්යේෂණ මගින් අනාවරණය කරගෙන ඇති ආකාරයට විදුලි වැට මගින් අලි-මිනිස් ගැටුම පාලනය කිරීම අසාර්ථක වී ඇත්තේ බොහොමයක් විදුලි වැටවල් නියමාකාරයෙන් ස්ථානගත වී නොතිබීම හේතුවෙනි. අලි-ඇතුන්ගේ වාසභූමි හා මිනිසුන් ජීවත් වන ගම්මාන අතර සීමාවේ විදුලි වැට ඉදි නොවී වෙනත් ප්‍රදේශ වල විදුලි වැට ඉදිවීම මෙම තත්ත්වය ඇති වීමට හේතු වී තිබේ. උදාහරණයක් වශයෙන් ඇතැම් විදුලි වැට ඉදිවී ඇත්තේ වනජීවී රක්ෂිත (ජාතික වනෝද්‍යාන, අභයභූමි වැනි) සීමා වල ය. එමගින් එම වනජීවී රක්ෂිත වල ජීවත් වන අලි-ඇතුන්ට පිටතට ඒමට නොහැකි වීමට පුළුවන. නමුත් අලි-ඇතුන් ජීවත් වන්නේ වනජීවී රක්ෂිත ඇතුළත පමණක් නොවේ. බොහෝ වනජීවී රක්ෂිත මායිම් ව ඇත්තේ ද මිනිස් වාසභූමි වලට නොව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කැලෑවලට ය. අලි ඇතුන් බොහොමයක් ජීවත් වන්නේ වනජීවී රක්ෂිත වලින් පිටත ඇති වනාන්තර කොටස්, බැදි කුට්ටි වල ය. වනජීවී රක්ෂිත වලින් පිටත ජීවත් වන අලින්ට මිනිසුන් ජීවත් වන ගම්මාන හෝ ගොවිබිම් ආක්‍රමණය කිරීමට, වනජීවී රක්ෂිත සීමාවේ සහ යාබද වනාන්තර අතර පිහිටි විදුලි වැට බාධාවක් නොවේ. වනජීවී රක්ෂිත වටා විදුලි වැට ඉදිකර, එම රක්ෂිත තුළට සියලු අලි-ඇතුන් සීමා කිරීමට කොතරම් උත්සාහ දැරුවද, මේ වනතෙක් එම උත්සාහය ද සම්පූර්ණයෙන් ම සාර්ථකත්වයක් අත්කරගෙන නැත.

වර්තමානයේ අලි-ඇතුන් විදුලි වැට බිඳ දැමීමට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ වගාබිම් ආවරණය වන පරිදි ඉදිකර ඇති ස්ථිර විදුලි වැට පිළිබඳ අවධානය, අස්වනු නෙළා ගැනීමත් සමග ම ගොවි ජනතාව කෙරෙන් ඉවත් වී යාම ය. එසේත් නැත්නම් එම වැට ගොවිබිම් වලින් බැහැර ව කැලෑව තුළ ස්ථාපනය වී තිබීම හේතුවෙන් එහි නඩත්තුව නිසියාකාරව සිදු නොවීම ය. කාලයාගේ ඇවෑමෙන් දුර්වල වන එවැනි විදුලි වැටවල් බිඳගෙන ගොවිබිම් ආක්‍රමණය කිරීම අලි-ඇතුන්ට පහසු වන අතර, එමගින් අලි-ඇතුන් විදුලි වැට බිඳ හෙළීමට ඉගෙන ගැනීමද සිදු වේ. අප යමක් ආරක්ෂා කර ගත යුතුද ඒ ඉලක්කය සාර්ථකව ඉටුකර ගැනීමට නම් ආරක්ෂක උපක්‍රමය අප ආරක්ෂාව ලබා දීමට තැත් කරන දෙයට සමීප විය යුතුය. අප නිවසේ ආරක්ෂාවට දොරටුවක් නිර්මාණය කරන්නේ එහි අගුල දැමූ විට වෙනත් කිසිවකුටත් නිවසට ඇතළු විය නොහැකි ලෙස ය. අප අපගේ ඉඩමට වැටක් ඉදිකර ගේට්ටුවක් යොදන්නේ පිටස්තර කිසිවකුත් අප ගෙවත්තට අනවසරයෙන් ඇතුළුවීම වැළැක්වීමට ය. අප නිර්මාණය කරන දොර හෝ වැට වෙනත් ගෙයක හෝ වත්තක තැබීමෙන් අප බලාපොරොත්තු වන ආරක්ෂාව නොලැබේ.

ඒ හා සමානව ම නිරන්තරයෙන් වන අලින්ට ගොදුරු වන කුඹුරුයාය වටා, වගා කරන කාලයේ දී විදුලි වැටක් ඉදිකිරීම මගින් අලි ප්‍රහාර වැළැක්වීමෙහි ලා අති විශාල සාර්ථකත්වයක් අත්කර ගත හැකිය. මෙම කාලීන විදුලි වැට මගින් වන අලින්ට කුඹුරු වලට හානි කිරීමට ඇති ඉඩකඩ ඉතා අවම වෙයි. ඊට හේතු වන්නේ කුඹුරු මායිමේ විදුලි වැට ඉදිකර ඇති විට ඒ ගැන අවධානය යොමු කිරීම හා ආරක්ෂා කර ගැනීම පහසු වීම ය. විදුලි වැට මාර්ගය දිගේ වර්ධනය වන වල් පැළ ඉවත් කිරීම, ශුද්ධ පවිත්‍ර කිරීම වැනි සුළු නඩත්තු කටයුතු සිදු කිරීම ද මෙමගින් පහසු වෙයි. ගොවීන් තම කුඹුරු අස්වැද්දීමට දක්වන උනන්දුව ම තම අස්වැන්න ආරක්ෂා කර දෙන විදුලි වැට ආරක්ෂා කර ගැනීමට ද යොදා ගැනීමට මෙම කාලීන කුඹුරු විදුලි වැට ක්‍රමය මගින් හැකියාව ලැබේ. වන අලින්ගේ වාසභූමි වලින් වගා කරන කාලයේ දී කුඹුරු වෙන් කර එය තහනම් ප්‍රදේශයක් වශයෙන් අලින්ට පැහැදිලි ව හඳුනාගත හැකි පරිදි සීමා කර ඇති නිසා අලින්ට එම කුඹුරු මග හරිමින්, අවශ්‍ය ආකාරයට උන්ගේ වාසභූමියේ සැරිසරමින් ආහාර හා ජලය සපයාගැනීමට ද බාධාවක් ඇති නොවේ. අලියකු වැට අසලට පැමිණි විට පැල් රකින ගොවීන්ට නිතැතින් ම දිස්වන හෙයින් එසේ අලියකු පැමිණි අවස්ථාවක වැට කඩා කුඹුරට ඇතුළුවීමට පෙර එම අලියා පලවා හැරීමට හැකිවනු ඇත. එමෙන්ම වැට සමීපයට පැමිණෙන අලියකුට ද ගොවීන් දිස්වන හෙයින් අලින් වැට කැඩීමට දරන ප්‍රයත්න ද ඉතා අල්ප වෙයි.

යායේ සිටින සියලුම ගොවීන් සාමූහික ව වගා කන්නය ආරම්භයේ කුඹුරුයාය වටා මෙම කාලීන විදුලි වැට ඉදිකිරීම සිදු කෙරේ. ඔවුහු අස්වනු නෙළා ඉවත් කරන දිනට මෙම විදුලි වැට ගලවා ඉවත් කරගෙන ගොස් තමන් කැමැති ආරක්ෂිත ස්ථානයක ගබඩා කර තබා ඉදිරි කන්නයේ දී නැවත භාවිතයට ගනිති.

මෙම කාලීන විදුලි වැට මගින් ලැබෙන තවත් ප්‍රතිලාභයක් වන්නේ අලි-ඇතුන්ට ඉපනැල්ල ආහාරයට ගැනීමට මෙමගින් බාධා එල්ල නොවීමයි. වියළි කාලයේ දී වනාන්තර තුළ අලි-ඇතුන්ට අවශ්‍ය ආහාර සීමිත බැවින් අලි-ඇතුන් ගම්වැදීම ඉහළ යයි. නමුත් එම අලි-ඇතුන්ට ඉපනැල්ල ආහාරයට ගැනීමට හැකියාව ලැබීම මගින් ආහාර හිඟය පාලනය වේ.

එමෙන්ම විශාල ලෙස කුඹුරු ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ වල අලි-ඇත්තු මිනිසුන් සමග ගැටුම් ඇති නොකරගෙන එක් කැලෑ රොදකින් තවත් කැලෑ රොදකට ගමන් කිරීම සඳහා වගා නොකරන කාලයේ දී එම කුඹුරු භාවිතා කරති. අප එම කුඹුරු බිම් ද ස්ථිර විදුලි වැටකින් හරස් කළහොත් අලි-ඇතුන් ඉන් ඉමහත් පීඩාවට පත් වන අතර, විදුලි වැට බිඳගෙන හෝ ගම්මාන හරහා නව මාර්ග තනාගෙන හෝ තමන්ගේ සංක්‍රමණ සිදු කිරීමට පෙළඹීම වඩාත් උග්‍ර අලි-මිනිස් ගැටුමකට මග පාදයි.

ඒ නිසා කුඹුරු මායිමේ කාලීන විදුලි වැට ඉදිකිරීම මගින් අලි-මිනිස් ගැටුම් පවතින ප්‍රදේශ වල ජනතාවට තම වී ගොවිතැන් ආරක්ෂා කරගෙන සතුටින් ජීවත් වීමට මග පෑදේ. දිවයිනේ විවිධ ප්‍රදේශ වල ගොවීන්ට මෙවැනි කාලීන කුඹුරු විදුලි වැට ඉදිකරගෙන වන අලි තර්ජන වලින් කුඹුරු ආරක්ෂා කර ගැනීමට මේ වනවිට හැකියාව ලැබී ඇත. එම කුඹුරු වලට එල්ල වූ වන අලි ප්‍රහාර සියයට අනූ නවයක්ම වළක්වා ගැනීමට එමගින් හැකියාව ලැබී තිබේ.

නමුත් මෙහි දී ඇති වන ගැටළුවක් වන්නේ කුඹුරුයාය වලින් දුර බැහැරව පිහිටා ඇති ගම්මාන ආරක්ෂා කර ගැනීමට කුඹුරු විදුලි වැට මගින් පිටුවහලක් නොලැබීමයි. ඒ සඳහා ඇති සරල විසඳුම කුඹුරු විදුලි වැට ඉදිකිරීමට සමගාමී ව ගම්මාන මායිමේ ස්ථිර ග්‍රාමීය විදුලි වැට ඉදිකිරීමයි. (වන අලින්ගෙන් ගම රැකදෙන ආරක්ෂිත විදුලි වැටක්, අත් පොත බලන්න)

අලි-මිනිස් ගැටුම පාලනය සඳහා කුඹුරුයාය ආරක්ෂා කරන කාලීන විදුලි වැට සහ ගම්මාන ආරක්ෂා කරන ස්ථිර විදුලි වැට ඉදිකිරීම ඉතා සාර්ථක ප්‍රතිඵල අත්කර දෙයි. කුඹුරු බිම් ආරක්ෂා කරමින් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම භාර ව කටයුතු කරන නිලධාරීන් ලෙස ඔබට සුවිශාල වගකීමක් පැවරී ඇත. මෙම කුඩා පොත් පිංච සකස් කර ඇත්තේ එම කටයුත්ත සාර්ථක ව ඉටුකිරීම සඳහා ඔබට පහසුවක් වීම පිණිස ය.

ඒ නිසා මෙය හොඳින් පරිශීලනය කර ලබා ගන්නා දැනුම්වත්භාවය තුළින් ඔබ ප්‍රදේශය තුළ පිහිටි වන අලි තර්ජනයට ලක් ව ඇති කුඹුරුයාය ආරක්ෂා කර ගැනීමට සක්‍රීය ව මැදිහත් වීමට ඔබට හැකිවේ යැයි යන්න අපගේ බලාපොරොත්තුවයි.

# වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්තුමන්ගේ පණිවුඩය

වර්තමානය වනවිට අලි මිනිස් ගැටුම දිනෙන් දින උග්‍ර වන ගැටලුවක් බවට පත්වී ඇත. ශ්‍රී ලංකාවේ කුඩා වපසරියක් තුළ සැලකිය යුතු අලි ගහණයක් විසිරී සිටීමත්, සංවර්ධන ක්‍රියාවලිය හේතුවෙන් දිනෙන් දින උග්‍ර වන ඉඩම් අවශ්‍යතාවය මත සතුන්ගේ වාසස්ථාන ක්‍රමානුකූලව අහිමි වීමත් මෙම ගැටලුවට හේතු වන අතර එය කළමණාකරණය කරගැනීමේ අභියෝගයට වර්තමානයේ දී අප මුහුණු දී සිටින්නෙමු. ගැටුම අවම කිරීම සඳහා රක්ෂිත කලාප ආවරණය වන පරිදි රක්ෂිත කලාප වටා විදුලි වැට ඉදිකරන අතර වන අලි විසිරී සිටින රක්ෂිත කලාප වලින් පිටත ගම්මාන වටා ද විදුලි වැට ඉදි කරනු ලැබේ. ඒ සඳහා වාර්ෂිකව රුපියල් මිලියන ගණනක් රජය විසින් වැය කරනු ලැබේ. එසේම වනජීවී සංරක්ෂණ නිළධාරීන්ගේ රාජකාරී කාලය 60% කට වඩා වැඩි ප්‍රමාණයක් මේ සඳහා වැය කිරීමට සිදු වී ඇත. කෙසේ වෙතත් විදුලි වැටකින් අපේක්ෂිත අරමුණු ඉටු කරගැනිම සඳහා මහජනතාවගේ සහාය අත්‍යාවශ්‍ය වේ.

මේ පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සඳහාත් නිවැරදි ක්‍රමවේදයක් අනුව විදුලි වැට නඩත්තු කිරීම පිළිබඳවත් සකස් කරන ලද මේ පොත් පිංච අලි මිනිස් ගැටුමෙන් පීඩා විඳිනු ලබන ජනතාවට මෙන්ම එය විසඳීමට උත්සාහ දරණ නිළධාරීන්ගේද පහසුව සඳහා ඉතාමත් ප්‍රයෝජනවත් වේ.

මෙවැනි වටිනා පොත් පිංචක් මුද්‍රණය කිරීමට කටයුතු කිරීම පිළිබඳව සංරක්ෂණ පර්යේෂණ ආයතනය වෙත මාගේ කෘතඥතාවය පළ කර සිටිමි.

**ඩබ්.එස්.කේ.පතිරත්න**
අධ්‍යක්ෂ ජනරාල්
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව


# විදුලි වැටක සාමාන්‍ය ක්‍රියාකාරිත්වය කෙබඳු ද?

විදුලි වැටක් මගින් සිදු කරන්නේ එහි ගැටෙන සතුන්ට විදුලි සැර වැදීමේ අප්‍රසන්න අත්දැකීමක් ලබා දීම ය. වනාන්තරයේ ජීවත් වන සතුන්ට එවැනි අත්දැකීමක් කිසිම අවස්ථාවක ලැබී නැත. එම අත්දැකීම වන සතුන්ට ආගන්තුක ය. බිය උපදවන සුළු ය. ඒ නිසා විදුලි කම්පනය හොඳහැටි අත්විඳි සතුන් ඉන්පසු විදුලි වැටේ ගැටීමෙන් වැළකී සිටී. එමගින් විදුලි වැට වන සතුන්ට බාධකයක් ලෙස ක්‍රියා කරයි.

විදුලි වැටක් සඳහා විදුලිය ලබා දෙන්නේ එනජයිසර (Energizer) යන්ත්‍රයක් මගිනි. එම යන්ත්‍රය වෝල්ට් 12 ක බැටරියකින් ලැබෙන ධාරාව හෝ වෝල්ට් 240 ගෘහස්ථ විදුලි පරිපථයකින් ලැබෙන ධාරාව, විදුලි වැටේ ගමන් කරන වෝල්ට් 6,000-8,000 ක පමණ ඉහළ වෝල්ටීයතාවක් සහිත වුවද ඉතා කුඩා ඇම්පියර් අගයක් සහිත DC (Direct Current) ධාරාවක් බවට පරිවර්තනය කරයි. එම ධාරාව ගලා යන්නේ කඩින් කඩ වශයෙනි. එක් ස්පන්දනයක් ගලා යාම තත්පරයකින් ඉතා කුඩා කොටසකට සීමා වෙයි. ඒ ස්පන්දන දෙකක් අතර තත්පරයක පමණ කාලයක් පවතී. ඒ නිසා විදුලි වැට ස්පර්ශ වීමෙන් සතුන්ට විශාල කම්පනයක් ඇති වන නමුත් කිසිදු හානියක් සිදු නොවේ. ක්‍රියාකාරී තත්ත්වයේ පවතින විදුලි වැටේ කම්බියක් ඇඟ දැවටෙන සතකු තුළින් අධි වෝල්ටීය ධාරාවක් පොළොව දක්වා ගමන් කර, පරිපථය සම්පූර්ණ වීමෙන් එම සතාට බලවත් කම්පනයක් ලබා දේ.

බැටරිය ආරෝපණය කිරීම සූර්ය බලයෙන් කළ හැකි අතර, සමහර එනජයිසර යන්ත්‍ර ගෘහස්ථ විදුලියෙන් ක්‍රියා කෙරේ.

## විදුලි වැටක ක්‍රියාකාරිත්වය දක්වන සටහන




E - එනජයිසරය
B/M - බැටරිය හෝ ගෘහස්ථ විදුලිය

# අලි-මිනිස් ගැටුම පාලනය සඳහා මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඒවායේ ඇති අඩු-ලුහුඬුකම්

විදුලි වැට අලි-මිනිස් ගැටුම පාලනය කිරීමට යොදා ගත හැකි ඉතා හොඳ මෙවලමකි. නමුත් මේ දක්වා ඉදිකර ඇති විදුලි වැට බොහොමයකින් අපේක්ෂා කරන ලද ප්‍රතිඵල නොලැබීමට ප්‍රධාන ම හේතුව අලි-ඇතුන්ගේ චර්යාවන් සහ හැසිරීම් රටා පිළිබඳ ව නිසි අවධානයක් යොමු නොකර එම විදුලි වැට ස්ථානගත කර තිබීම ය.

අලි රංචුවක සාමාජිකත්වය දරන්නේ ගැහැනු සතුන් හා ලිංගික ව පරිණත නොවූ, එසේ නැතහොත් වැඩිවියට නොපැමිණි පිරිමි සතුන් පමණි. පිරිමි අලි පැටවුන් ලිංගික ව පරිණත වීමත් සමග වනයේ තනි ව ජීවත් වීමට පෙළඹෙති. එම සතුන් සාමාන්‍ය ව්‍යවහාරයේ දී 'තනි අලි' ලෙස හැඳින්වේ. එම තනි අලි ඇතැම් අවස්ථා වල කිහිපදෙනා බැගින් කුඩා කණ්ඩායම් සෑදීමට ද පෙළඹේ.

අලි-ඇතුන්ට තමන්ට ම ආවේණික වූ වාසභූමි තිබේ. එම සතුන් තමන්ගේ වාසභූමි වලට විශාල ඇල්මක් හා බැඳීමක් දක්වන අතර, වසර පුරා විවිධ කාල වල දී තමන්ගේ වාසභූමියේ විවිධ ප්‍රදේශ වලට ගමන් කරමින් ආහාර හා ජලය සපයා ගනී. ඒ සඳහා අලි-ඇතුන් දිනකට කිලෝමීටර් පහක පමණ දුර ප්‍රමාණයක් පා ගමනේ යෙදේ. සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ අලි-ඇතුන්ගේ වාසභූමි වර්ග කිලෝමීටර් පනහත්-දෙසීයත් අතර විශාල ප්‍රදේශයක පැතිර පවතී. අලි-ඇතුන්ගේ පැවැත්මට දිනකට විශාල ආහාර ප්‍රමාණයක් අවශ්‍ය වේ. එම ආහාර අවශ්‍යතාව සපුරා ගැනීමට අලි-ඇතුන් තමන්ගේ වාසභූමි පුරා සංක්‍රමණය වේ. ඒ අතරතුර තම වාසභූමියේ ඇති ගම්බිම් ද ආක්‍රමණය කිරීමට සමහර අලි-ඇතුන්, විශේෂයෙන් සමහර වැඩිමහලු පිරිමි සතුන් පෙළඹෙති.

ගැහැනු සතුන් හා පැටවුන්ගෙන් සමන්විත අලි රංචු මිනිසුන්ගේ ගම්බිම් ආක්‍රමණය කිරීමට උත්සාහ දරන්නේ ඉතා සීමිත වශයෙනි. බොහෝ ප්‍රදේශ වල එය මිනිස් වාසස්ථාන වලින් දුර බැහැර පිහිටි අනාරක්ෂිත වගාබිම් වලට සීමා වේ. නමුත් සමහර තනි අලි හෙවත් වැඩිමහලු පිරිමි අලි ගම්මාන වෙත පැමිණ මිනිසුන්ගේ බවභෝග හා දේපොළ හානි කිරීමට වැඩි නැඹුරුතාවක් දක්වති. එම අවස්ථා වල ඔවුන් අතින් මිනිස් ජීවිත ද හානි විය හැක.

මෙතෙක් කලක් බොහෝ අවස්ථා වල මෙසේ ඇති වන අලි-මිනිස් ගැටුම් මැඩපැවැත්වීමට සිදු කළේ ප්‍රශ්න ඇති කරන හා නොකරන සියලු අලි-ඇතුන් ඔවුන්ගේ වාසභූමියේ කොටසකට සීමා කර විදුලි වැටක් ඉදිකිරීමට තැත්කිරීම ය. එසේත් නැතිනම් එම සතුන් සම්පූර්ණයෙන් ම ඔවුන්ගේ වාසභූමියෙන් පිටතට එළවා පිටස්තර ප්‍රදේශයක තිබෙන වන උද්‍යානයකට හෝ අභයභූමියකට ගාල් කිරීමට තැත්කිරීම ය.

මෙම වන අලි පාලන ක්‍රමයේ පදනම සියලු අලි-ඇතුන් වනජීවී රක්ෂිත වලට සීමා කිරීම වුව ද, වසර හැත්තෑවක පමණ සිට මෙම ඉලක්කය සපුරා ගැනීමට දරන ලද ඉමහත් උත්සාහයන් මේ දක්වා බොහෝ විට අසාර්ථක වී ඇත. මේ දක්වා වනජීවී රක්ෂිත වලින් පිටත වන අලින් දිවි ගෙවන ප්‍රදේශ සියල්ලක ම පාහේ අලි පැන්නීමේ මෙහෙයුම් සිදු කර ඇත. එනමුත් වනජීවී රක්ෂිත වලින් පිටත වන අලින් දිවි ගෙවන ප්‍රදේශ වල අලි-ඇතුන්ගේ පැවැත්මට සුදුසු පරිසර තත්ත්ව පවතින කිසිම අවස්ථාවක එම සතුන් ඉන් ඉවත් කිරීමට මේ දක්වා හැකියාව ලැබී නැත.

අද වන විට ද ශ්‍රී  ලංකාවේ වෙසෙන අලි-ඇතුන්ගෙන් සියයට හැත්තෑවකට වඩා ජීවත් වන්නේ වනජීවී රක්ෂිත වලින් පිටත ය. අලි-මිනිස් ගැටුම සම්පූර්ණයෙන් ම ව්‍යාප්ත ව පවතින්නේ මෙම වනජීවී රක්ෂිත වලින් බැහැර ප්‍රදේශ වල ය.

එමෙන්ම තමන්ගේ නිජබිම් වලින්, වාසභූමි වලින් පන්නා පිටුවහල් කර පිටස්තර වනජීවී රක්ෂිත වලට ගාල් කළ අලි රංචු වල සිටින අහිංසක ගැහැණු සතුන්ට හා පැටවුන්ට ආගන්තුක පරිසරය තුළින් උන්ගේ එදිනෙදා අවශ්‍යතාවන් සපුරා ගැනීමට නොහැකි වේ. එවැනි අවස්ථා වල එම සතුන් විදුලි වැටෙන් කොටු වූ ප්‍රදේශය තුළ සිරවී ආහාර හිඟයකට මුහුණ දෙති. එමගින් ඇති වන පෝෂණ දුර්වලතා නිසා, විශේෂයෙන් කුඩා අලි පැටවුන් ඉතා අවාසනාවන්ත ලෙස දුක් විඳ බඩගින්නේ මිය යෑම සිදු වේ.

තමන්ගේ ආවේණික වාසභූමියේ කොටසකට හෝ ඉන් බැහැර ප්‍රදේශයකට ගාල් කර ඉදිකෙරුණු විදුලි වැට පෙරළාගෙන පිටතට පැමිණෙන අලි-ඇතුන්ට

හෝ වනජීවී රක්ෂිත වටා ඉදිකෙරුණු විදුලි වැට වලින් පිටස්තර ව වාසය කරන අලි-ඇතුන්ට ගම්මාන වලට ඇතුළු වී මිනිසුන්ගේ බවභෝග, දේපොළ හා ජීවිත විනාශ කිරීමට කිසිම බාධාවක් නැත. එසේම නිතර නිතර අලි-ඇතුන් පළවා හැරීමේ මෙහෙයුම් සිදු කිරීමෙන් හා ඒවාට විශාල වශයෙන් අලි වෙඩි භාවිතා කිරීමෙන් සහ අලි ඇතුන්ට පතොරම් තුවක්කු වලින් වෙඩි තැබීමෙන් අලින්ගේ ප්‍රචණ්ඩත්වය වර්ධනය වේ. මිනිසුන් කෙරේ වෛරයක් ඇති වේ. අලි රංචු වල සිටින කුඩා අලි පැටවුන් මිනිසුන්ගේ අලි වෙඩි, ශබ්ද නැගීම් හා ගින්දර වැනි අලි-ඇතුන් සාමාන්‍යයෙන් බියක් දක්වන සාධක වලට නිතර මුහුණ දීම සිදු වේ. එමගින් ඒවාට ඇති බිය ඉවත් වී යයි. මෙලෙස දිගින් දිගට ම අප අලින් සමග ගැටීමෙන් එම ගැටුම තව තවත් වර්ධනය වනවා මිස ගැටුම සංසිඳීමක් සිදු නොවේ. එය ඉදිරියේ දී තව තවත් බරපතල අලි-මිනිස් ගැටුම් ඇති වීමට හේතු වේ.

අලි-ඇතුන් යනු ශක්තිමත්, බුද්ධිමත් හා සංවේදී සත්ත්ව විශේෂයකි. වඳවීමේ තර්ජනයට ලක්ව සිටින අලි-ඇතුන් ශ්‍රී ලංකාවේ නීතිය යටතේ දැඩිව ආරක්ෂාව ලබා දී ඇති සත්ත්ව විශේෂයක් ද වේ. ඒ නිසා එම සතුන්ගේ වාසභූමි සීමා කර හෝ එම වාසභූමි වලින් එම සතුන් පිටමං කර අලි-මිනිස් ගැටුම විසඳීම යතාර්ථයක් නොවන බව අප වටහා ගත යුතුය. තමන් ගමක් හෝ ගොවි සමිතියක් ලෙස සංවිධානය වී තම ගමට හෝ කුඹුරුයායට ආරක්ෂාව සලසා ගැනීම ඊට වඩා සාර්ථක ව සහ ක්ෂණික ව අලින්ගෙන් ඇති වන හානි වළක්වා ගැනීමට හැකි ක්‍රමවේදයකි.

වන අලි ප්‍රහාර වලට ලක් වන ගම්මාන වල ජනතාවගේ ඉල්ලීමක් වන්නේ 'ප්‍රශ්නකාරී වන අලින්' අල්ලා වෙනත් දුර බැහැර ප්‍රදේශයකට ගෙන ගොස් දැමිය යුතු බව ය. එම අලි පාලන ක්‍රමවේදය හඳුන්වන්නේ අලි-ඇතුන් පරිස්ථාපනය (Translocation) යනුවෙනි.

විශේෂයෙන් මිනිස් ජීවිත හා දේපොළ වලට තර්ජන එල්ල කරන බවට චෝදනා ලබන අලි-ඇතුන් මේ ආකාරයෙන් පරිස්ථාපනය කෙරේ. ඒ අනුව නිර්වින්දනය කර, අල්ලා බැඳ, ලොරියක බහා එම සතුන් තමන් වෙසෙන පාරම්පරික වාසභූමියෙන් ඉවත් කර වඩාත් දුර බැහැර ආගන්තුක පරිසරයක පිහිටි වනජීවී රක්ෂිතයකට පිටමං කිරීම සිදු කෙරේ.

නමුත් මෙසේ පරිස්ථාපනය කරන ලද අලි-ඇතුන්ට GPS චන්ද්‍රිකා රේඩියෝ කර පටි පළඳවා සංරක්ෂණ පර්යේෂණ ආයතනය සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සිදු කර ඇති පර්යේෂණ මගින් අනාවරණය වී ඇත්තේ ප්‍රශ්න

ඇති කරන ප්‍රචණ්ඩකාරී තනි අලින් කිසි ලෙසකත් තමන් ගෙන ගොස් දමන වනජීවී රක්ෂිත තුළට සීමා නොවන බව ය. එම රක්ෂිත වටා විදුලි වැටවල් ඇත්නම් ඒවා කෙසේ හෝ කඩා බිඳ දමමින් ඔවුහු නැවතත් මිනිස් වාසස්ථාන කරා පැමිණෙති. එම සතුන් අතරින් සමහරක් ආගන්තුක පරිසරයට හැඩගැසීමට නොහැකි ව අකාලයේ මරණයට පත්වෙති. එසේ නැතහොත් එම ආගන්තුක පරිසරයේ නැවතත් මිනිසුන් සමග ගැටුම් ඇති කර ගැනීමට හෝ කිලෝමීටර් සිය ගණනක් ගෙවා පෙරළා තම මුල් වාසභූමියට පැමිණීමට එම සතුන් පසුබට නොවෙති.

අලි-මිනිස් ගැටුම පාලනය සඳහා ගම්මාන ආරක්ෂා කරමින් ස්ථිර විදුලිවැට ද කුඹුරු ආරක්ෂා කරමින් කාලීන විදුලිවැට ද ඉදිකිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ජනතාව වෙත යන ඔබ මේ පිළිබඳ ව දැනුම්වත් වී සිටීම ඉතා වැදගත් වේ.

අලි-ඇතුන් කොහේ සිට කුමන ආකාරයකින් පැමිණිය ද එම සතුන්ට කුඹුරට හෝ ගමට ඇතුළු වීමට නම් මෙම යෝජිත ප්‍රජා මූලික ව්‍යාපෘති තුළින් කුඹුර වටා හෝ ගම්මානය වටා ඉදිකර ඇති හොඳින් නඩත්තු කරන ශක්තිමත් විදුලි වැට බිඳින්නට සිදු වේ. එමෙන්ම විදුලි වැට ඉදිකර තිබෙන්නේ කුඹුරු හෝ ගම්බිම් ආරක්ෂා කර ගැනීමට මිස අලි-ඇතුන්ගේ ගමන් මාර්ග හෝ වාසභූමි හරස් කර නොවන බැවින් ඒවා මගහැර උන්ගේ වාසභූමියේ ඇවිද ගොස් ආහාර හා ජලය සපයා ගැනීමට අලි-ඇතුන්ට වැඩි නිදහසක් ලැබෙන නිසා ඔවුන් ගම්වැදීමේ ප්‍රවණතාවය බෙහෙවින් අඩු වේ.

# කුඹුරු ආරක්ෂා කර දෙන කාලීන විදුලි වැට ඉදිකිරීමේ පියවර

පළමු පියවර

**මූලික සාකච්ඡා පැවැත්වීම හා විදුලි වැට ඉදිකිරීමට අපේක්ෂිත ප්‍රදේශය පරීක්ෂා කිරීම**

කුඹුරුයාය වටා වගා කන්නයේ දී ඉදිකරනු ලබන කාලීන විදුලි වැට පිළිබඳ ව උනන්දුවක් දක්වන ගොවි සමිතියේ නිලධාරීන් සමග මූලික සාකච්ඡා වටයක් පවත්වා විදුලි වැට ඉදිකිරීමට බලාපොරොත්තු වන ප්‍රදේශය පරීක්ෂා කර බැලීම මෙම පියවරේදී සිදු කෙරේ. වන අලි ප්‍රහාර වලින් කුඹුරුයාය ආරක්ෂා කර දෙන කාලීන විදුලි වැට ඉදිකිරීමේ වැඩසටහනේ පළමු පියවර මෙයයි. මෙම සාකච්ඡාවේදී අදාළ කුඹුරු වලට කොතරම් වන අලි ප්‍රහාර එල්ල වනවාද, එම ප්‍රහාර වළක්වා ගැනීමට ගොවීන් මෙතෙක් දරා ඇති උත්සාහයන් මොනවාද, ඒවායේ සාර්ථක-අසාර්ථක බව කෙබඳුද යන කරුණු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. මෙම කාලීන විදුලි වැට පිළිබඳව ඊට උනන්දුවක් දක්වන පිරිසට මූලික දැනුම ලබා දීම මෙම පියවරේ දී ඔබ වෙත පැවරෙන සුවිශේෂී වගකීමයි. කාලීන විදුලි වැට තමන්ට ප්‍රයෝජනවත් වනු ඇතැයි ගොවීන් තුළ විශ්වාසය ඇති කරවීම මෙහි දී සිදු කළ යුතුය. ඔවුන් ඒ පිළිබඳව විශ්වාසය තබා කටයුතු කිරීමට කැමැත්ත පළකළහොත් විදුලි වැට ඉදිකර පවත්වාගෙන යාම සඳහා ඇති කර ගත යුතු එකඟතාවන් පිළිබඳව ඔවුන්ට මූලික අවබෝධයක්ද මෙම පියවරේදී ලබා දේ. ඉන්පසු කුඹුරුයායේ සියලුම ගොවීන් ඒකරාශි වී මේ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කර මෙම කටයුත්ත ඉදිරියට සිදු කරගෙන යනවාද යන්න තීරණය කිරීමට අවස්ථාව ලබා දිය යුතුය.

මේ සමග ම විදුලි වැට ඉදිකළ හැකි ආකාරය හා එහි ගමන් මග පිළිබඳ ව මූලික අධ්‍යයනයක් සිදු කිරීම සඳහා GPS දත්ත කිහිපයක් ලබාගෙන ඉන්පසු ඒවා විශ්ලේෂණය කිරීම ද සිදු කළ යුතුය.

මෙහි දී සැලකිලිමත් විය යුතු කරුණු:

- එක් විදුලි වැටක් මගින් සම්පූර්ණ කුඹුරුයායක් ආවරණය කිරීම වඩාත් යෝග්‍ය වන අතර, යායේ කොටසක් පමණක් ආවරණය වන සේ වැට ඉදිකිරීම එහි සාර්ථකත්වය හීන වීමට බලපායි.
- විදුලි වැට මගින් ආවරණය කිරීමට අපේක්ෂා කරන ප්‍රදේශය තුළ කිසිදු ළඳු කැලෑවක්, බැදි කුට්ටියක් හෝ වනාන්තර කොටසක් නොපැවතිය යුතුය.

දෙවැනි පියවර

## වැඩිදුර තොරතුරු ඉදිරිපත් කිරීම හා සංවාදය

පළමු හමුවෙන් සති දෙකකට පමණ පසු කාලීන විදුලි වැට පිළිබඳව යායේ සියලුම ගොවීන් දැනුම්වත් කිරීම සඳහා රැස්වීමක් පැවැත්විය යුතුය. විදුලි වැට මගින් ආරක්ෂාව ලැබීමට බලාපොරොත්තු වන කුඹුරුයායේ සෑම ගොවි මහතකුම මීට සහභාගි වීම අත්‍යවශ්‍යය. අලි-මිනිස් ගැටුම පාලනය කරන්නේ කෙසේද, ඊට විදුලි වැට යොදා ගන්නේ කෙසේද යන කරුණු පිළිබඳව මෙම රැස්වීමේ දී වැඩිදුර තොරතුරු ලබා දීම සිදු කළ යුතුය. එසේම විදුලි වැට ඉදිකර පවත්වාගෙන යාමට අදාළ කොන්දේසි හා එකඟතාවන් ගැනත් ගොවීන් ගැඹුරින් දැනුම්වත් කළ යුතුය.

කාලීන විදුලි වැටක් සාර්ථක වන්නේ එමගින් ආරක්ෂාව සපයා ගන්නා යායේ ඇති සියලු කුඹුරු වල වගා කටයුතු එකම කාලසටහනකට අනුව සිදුකළහොත් පමණි. ඒ අනුව එකම කාල සීමාවක් තුළ වගා කන්නය ආරම්භ කිරීම, පවත්වාගෙන යාම හා අස්වනු නෙළීම සිදු කළ යුතුය. කුඹුරු වැට ගලවා ඉවත් කිරීම සඳහා දිනයක් යොදා ගැනීමේදීද එය පහසුවකි.

විදුලි වැට ස්ථාපිත කිරීමට සහ නඩත්තු කිරීමට පූර්ණ ශ්‍රම දායකත්වය ලබා දීමට අමතරව ඒ සඳහා ගොවීන්ගේ මූල්‍ය දායකත්වය ලබා ගැනීම එහි සාර්ථකත්වය සඳහා තීරණාත්මකය. ඒ සඳහා ප්‍රමාණවත් මුදලක් නියම කොට විදුලි වැටෙන් ආවරණය වන ප්‍රදේශයේ ඉඩම් අයිතියට සාපේක්ෂව එක් එක්



*කුඹුරු යායක් ආරක්ෂා කරගැනීම සඳහා කාලීන විදුලි වැටක් ඉදිකිරීම පිළිබඳව මූලික සාකච්ඡාව සිදුකිරීම.*



*කුඹුරු යායක් වටා කාලීන විදුලිවැට ඉදිකිරීමට අවශ්‍ය කම්බි රැහැන් සූදානම් කිරීම - වෙප්පන්කුලම, ත්‍රිකුණාමලය*



*කුඹුරු යායක් වටා කණු සිටුවා විදුලිවැට කම්බි රැහැන් ඇදීම සිදුකරන ආකාරය - වෙප්පන්කුලම, ත්‍රීකුණාමලය*



*වැට කණු සිටුවීම සඳහා විශේෂයෙන් සකස් කල පී.වී.සී. බාහකයක්*

කුඹුරු හිමියන් විසින් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය (අක්කරයකට යම් කිසි මුදලක් වශයෙන්) නියම කර ගැනීම යෝග්‍යය. ඒ මුදල කුඹුරු රකින මේ වැටේ අනාගත නඩත්තුව සඳහා ඇති කෙරෙන අරමුදලක අත්තිකාරම වනු ඇත. ඊට අමතරව සෑම කන්නයක් අවසානයේම ප්‍රමාණවත් මුදලක් නියම කොට (අක්කරයකට වී බුසලක් හෝ ඊට සරිලන මුදලක් වැනි) එය එකතු කර නඩත්තු අරමුදල වර්ධනය කර ගත යුතුය. මෙම කාරණා පැහැදිලි කර ඒ සෑම කරුණක් පිළිබඳවම සියලු දෙනාටම කතා බහ කර ප්‍රශ්න අසා සියල්ල පැහැදිලි කර ගැනීමට මෙම පියවරේ දී අවස්ථාව ලබා දිය යුතුය.

විදුලි වැට ඉදිකිරීමේ ඉදිරි වැඩ කටයුතු සැලසුම් කළ යුත්තේ මෙම සාකච්ඡාවේ දී ඉදිරිපත් වන කැමැත්ත අනුවය. ගොවි සමිතියේ සාමාජිකයන් සියළුදෙනා තමන්ගේ කුඹුරුයාය වන අලින්ගෙන් ආරක්ෂා කර දෙන කාලීන විදුලි වැට ඉදිකිරීමට කැමැත්ත පළකළහොත් ඊළඟ පියවරට දින යොදා ගනු ලැබේ. එනම් විදුලි වැට මාර්ගය සැලසුම් කිරීමේ පියවරයි.

තුන්වැනි පියවර

## විදුලි වැට මාර්ගය සැලසුම් කිරීම

යායේ සියලුම ගොවීන් විදුලි වැට ඉදිකිරීමට එකඟතාවය පළ කර සතියක් පමණ කාල සීමාවක දී විදුලි වැට මාර්ගය සැලසුම් කිරීමේ රැස්වීම පැවැත්විය යුතුය. ඊට සියලුම ගොවීන් සහභාගි කර ගැනීම අත්‍යවශ්‍යය.

මෙම රැස්වීමේදී මුලින්ම වන අලින්ගෙන් කුඹුරුයාය ආරක්ෂා කර දෙන කාලීන විදුලි වැට ඉදිකිරීමේ භාරධූර කාර්යයට නායකත්වය දීමට අවශ්‍ය 'විදුලි වැට කමිටුව' පත් කර ගත යුතුය.

- විදුලි වැට මගින් ආවරණය කිරීමට අපේක්ෂා කරන ප්‍රදේශය තුළ වගා කටයුතු කරන ගොවීන් එක ගොවි සමිතියක සාමාජිකයන් වීම වඩාත් සුදුසු ය. එවිට එම ගොවි සමිතියේ නිලධාරි මණ්ඩලයටම විදුලි වැට කමිටුව ලෙසද ක්‍රියා කළ හැකිය.
- එක් යායක ගොවි සමිති එකකට වඩා වැඩි ගණනක් ඇත්නම් ඒ සියලු සමිති එකඟතාවකට පැමිණ සියලු ගොවි සමිති නියෝජනය වන පරිදි නිලධාරීන්ගෙන් සමන්විත එක් විදුලි වැට කමිටුවක් පත්කර ගත යුතුය.

- එක් ගොවි සමිතියක් විදුලි වැට කමිටුව සේ ක්‍රියා කළද තෝරා පත් කර ගත් ඒකාබද්ධ විදුලි වැට කමිටුවක් පිහිටවූවද, විදුලි වැට සම්බන්ධ කටයුතු සඳහා පමණක් සීමා වූ වෙනම බැංකු ගිණුමක් විවෘත කර පවත්වාගෙන යාම අනිවාර්යයෙන් සිදු කළ යුතුය.
- විදුලි වැට කමිටුවේ තීන්දු තීරණ වලට එකඟව කටයුතු කිරීමට සියලු ගොවීන් සහ ගොවි සංවිධාන එකඟ විය යුතුය.

නඩත්තු අරමුදල වෙනුවෙන් මුදල් එකතු කර අවසන් කර බැංකු ගිණුමක් ස්ථාපනය කිරීම සඳහා දින වකවානු තීරණය කර ගැනීමද මෙහි දී සිදු කළ යුතුය.

විදුලි වැට ඉදිකිරීමට හැකියාව ඇති මාර්ගය කුමක්ද යන්න සියලු දෙනාගේ එකඟතාවයෙන් තීරණය කිරීම හා තෝරාගත් මාර්ගයේ GPS දත්ත ලබා ගැනීම ද මෙම පියවරේ දී සිදු කෙරේ.

හතරවැනි පියවර

## විදුලි වැට මාර්ගය සිතියම්ගත කිරීම සහ අවශ්‍ය ද්‍රව්‍ය නිර්ණය

විදුලි වැට මාර්ගයෙහි GPS දත්ත පරිගණක උපකාරයෙන් සිතියම්ගත කිරීම මෙම පියවරේ දී සිදු කෙරේ. ඒ සඳහා Google Earth සිතියම් භාවිතා කිරීම වඩාත් යෝග්‍ය ය.

ඉන්පසු වැටෙහි දිග ගණනය කර, වැටෙන් ආවරණය වන ප්‍රදේශයේ අක්කර ගණන ගණනය කළ යුතුය. ආවරණය වන ප්‍රදේශය ගොවීන්ගේ අදහස් අනුව අනුමාන කළ ප්‍රදේශය හා ගැළපිය යුතුය. එසේ නොමැති නම් නැවත GPS දත්ත ලබා ගෙන එය නිරාකරණය කළ යුතුය.

අවශ්‍ය නම් කුඹුරු කොටස් GPS මගින් මැන එක් එක් ගොවි මහතාට නියම වන මුදල් ප්‍රමාණය සඳහන් ලැයිස්තුවක් විදුලි වැට කමිටුවට ලබා දිය හැක.

වැටට අවශ්‍ය විවිධ වර්ග වල වැට කණු ප්‍රමාණයද, අවශ්‍ය සෙසු අමුද්‍රව්‍ය ලැයිස්තුවද සකස් කර එම අමුද්‍රව්‍ය ඇණවුම් කිරීමටද කටයුතු කළ යුතුය.



කුඹුරු විදුලිවැටේ කොන් කණුවක් වැර රැහැනක් යොදා ශක්තිමත්ව ඇද සකස් කිරීම - රොටවැව , තිස්සමහාරාමය



කාලීන විදුලි වැටක එනජයිසරය ඇතුළු උපාංග තැන්පත්කිරීම සඳහා යොදාගෙන ඇති අඩු වියදම් එනජිසර් කුටිය




එනජයිසර් කුටියක ඇතුලත උපාංග තැන්පත් කර ඇති ආකාරය




කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව, වැගෙදර ප්‍රදේශයේ සාර්ථකව පවත්වාගෙන යන කුඹුරු විදුලි වැටක නාම පුවරුව

පස්වැනි පියවර

## විදුලි වැට මාර්ගය සලකුණු කිරීම

විදුලි වැට සඳහා තීරණය වූ අරමුදල් රැස්කර, බැංකු ගිණුමක් ස්ථාපිත කර ගැනීමෙන් අනතුරුව විදුලි වැට මාර්ගය සලකුණු කිරීමේ පියවරට යාමට හැකියාව ලැබේ.

ඒ සඳහා විදුලි වැට කමිටුවේ නිලධාරීන් මෙන්ම ප්‍රමාණවත් තරම් අත්උදව්කරුවන්ද සූදානම් කර ගත යුතුය. විදුලි වැට සඳහා ශ්‍රම දායකත්වය ලබා දීමේදීද එක් එක් ගොවි මහතා විසින් ලබා දිය යුතු ශ්‍රමය විදුලි වැටෙන් ආරක්ෂා වන ප්‍රදේශයේ ඉඩම් හිමිකමට සමානුපාතික වන පරිදි නිර්ණය වීම වඩාත් සුදුසුය.

වැට මාර්ගය සලකුණු කිරීමට ප්‍රමාණවත් තරම් වැට ඉනි සපයා ගැනීම පිළිබඳවද මෙහි දී විශේෂ අවධානය යොමු කිරීම වැදගත් වේ. පසුගිය ගමන් වාර වලදී තීරණය කරගත් පරිදි හා වැට ඉදිකිරීමට ඇති අවහිරතා ඉවත් වන පරිදි කුඹුරුයායේ මායිම ඔස්සේ ඇවිද යමින් වැට ඉනි යොදා විදුලි වැට මාර්ගය භූමියේ සලකුණු කිරීම මෙම පියවරේ දී සිදු කෙරේ. එවිට විදුලි වැට මගින් ආවරණය කිරීමට අපේක්ෂා කරන ප්‍රදේශය තුළ කිසිදු ළඳු කැලෑවක්, බැදි කුට්ටියක් හෝ වනාන්තර කොටසක් නොපවතින ආකාරයට වැට මාර්ගය යොදා ගත යුතුය. කුඹුර මැද සිට බලන කළ ඒ වටා ඉදිකර ඇති වැට දිස් විය යුතුය.

හයවැනි පියවර

## විදුලි වැට මාර්ගය එළි-පෙහෙළි කිරීම

වැට මාර්ගය සලකුණු කරනු ලබන දිනයේ දී ගොවීන් සියලු දෙනාගේ කැමැත්ත පරිදි සලකුණු කළ මාර්ගය එළි-පෙහෙළි කර අවසන් කිරීම සඳහා දිනයක් නියම කරගත යුතුය. ඒ අනුව ගොවීන් විසින් මීටර 2 ක් පමණ පළල බිම් තීරුවක් එළිපෙහෙළි කොට තණකොළ ඉවත් කොට හැකි පරිදි සමතලා වන පරිදි සකස් කළ යුතුය.

එම කටයුත්ත නිමා කර දැනුම් දීමෙන් පසුව නියමාකාරයෙන් එළි-පෙහෙළි කර ඇත්දැයි සොයා බලා අඩුපාඩු තිබේ නම් තවත් ප්‍රමාණවත් කාලයක් ලබා දී එම කටයුත්ත අවසන් කරවීම කළ යුතුය.

සත්වැනි පියවර

## විදුලි වැට ස්ථාපනය කිරීම

විදුලි වැට නිමවෙන පරිශ්‍රය හොඳින් ශුද්ධ පවිත්‍ර වී ඇත්නම්, නියමිත දිනයට කණු සිටුවා කම්බි ඇද විදුලි වැට ස්ථාපිත කර ගත හැකිය. කණු සඳහා ගැල්වනයිස් යකඩ බට (GI) යොදා ගන්නා හෙයින් එකම අවස්ථාවේ කණු වළවල් නිම කිරීමත් කණු සිටුවීමත් කළ හැකිය. වැට සෘජු රේඛාවක් ඔස්සේ ඇදී යන විට දී කණු අතර පරතරය මීටර් 15ක් පමණ වන සේ පවත්වා ගත හැකි අතර, වැටේ දිශාව වෙනස් වන තැන්හිදීත් අමතර කණු යෙදිය යුතුය.

කණු සිටුවීමට නියමිත ස්ථාන වල වළවල් හාරා එහි සිටුවීමට නියමිත කණුවේ ප්‍රමාණයට අදාළ ප්‍රමාණයේ පීවීසී කොපු සිටුවා ඒ වටා වැලි යොදා තද කර ආවරණය කෙරේ. ඉන්පසු ගැල්වනයිස් යකඩ බට කණු පීවීසී කොපු තුළට බහා සිටුවීම සිදු කරනු ලැබේ (ඡායාරූපය බලන්න).

එනජයිසරය තැන්පත් කිරීම සඳහා කුඩා ආරක්ෂිත කුටීරයක් සකස් කර ගත යුතුය. එය අමානෝ තහඩු වලින් ආවරණය කර සකස් කර ගැනීම සුදුසු වන අතර, කණු මත රඳවා කන්නය අවසානයේ ගලවා ඉවත් කර ගත හැකි ලෙස සකස් කර ගැනීම යෝග්‍ය ය.

අවසන් පියවර

## විදුලි වැට ගොවි සමිතිය වෙත පැවරීමේ උත්සවය

මෙම අවස්ථාවට විශේෂයෙන්ම ගොවිජන සේවා අධ්‍යක්ෂකතුමන්, ප්‍රාදේශීය ලේකම්තුමන්, පොලිස්, වන සංරක්ෂණ සහ වනජීවී සංරක්ෂණ නිලධාරීන් සහ දේශපාලන අධිකාරිය ද සහභාගි කරවා ගැනීම සුදුසුය. එහිදී වැට ලබාදීමේ හා නඩත්තු කිරීමේ කොන්දේසි මාලාව ඇතුළත් ගිවිසුම් පත්‍රය විදුලි වැට කමිටුවේ නිලධාරීන් විසින් තම අත්සන් තබා ප්‍රාදේශීය ලේකම්තුමන් ඇතුළු ආරාධිත අමුත්තන් කිහිප දෙනකුගේද අත්සනින් යුතුව ගොවීන් වෙත පිළිගැන්වීම යෝග්‍ය ය.

ඒ සමගම වගා කන්නය අවසානයේ වැට ගළවා ඉවත් කර ඊළඟ කන්නය ආරම්භ වන තුරු ගබඩා කර තැබීම පිළිබඳවද සාකච්ඡා කර එකඟතාවක් ඇති කර ගත යුතුය. මුළු යායම එක් දිනක දී අස්වනු නෙළා අවසන් කළ නොහැකිනම්,



*කාලීන කුඹුරු විදුලිවැට මගින් ආරක්ෂාකර පවත්වාගෙන යන සාර්ථක වී වගාවක් - ගලපිටදිගන, ඇහැටුවැව*



*කුඹුරු විදුලිවැටක විදුලි ධාරාව ගලායන ප්‍රමාණය 'මල්ටි මීටර්' උපකරණයක් මගින් මැන බලන ආකාරය*



*ගොවි මහතෙකු සමග කුඹුරු විදුලි වැටක් අධීක්ෂණය කරන අවස්ථාවක් - කැලිගම, හම්බන්තොට*



*ගොවි මහතෙකු විසින් කාලීන කුඹුරු විදුලිවැටක් නඩත්තු කිරීමේ යෙදෙන අවස්ථාවක් - මාන්නක්කුලියාගම, ඇහැටුවැව*



කුඹුරු විදුලි වැටක් මගින් වන අලින්ගෙන් ආරක්ෂා කරන ලද සශ්‍රීයක කුඹුරු යායක අස්වනු ලබාගන්නා අවස්ථාවක් - කැලිගම, හම්බන්තොට



කාලීන කුඹුරු විදුලි වැටක් මගින් ප්‍රතිලාභ ලබන ගොවි පවුලක සාමාජිකයින් ඉහළ අස්වැන්නක් ලබා සතුටෙන් පසුවන අයුරු - හුනියම්පැලැස්ස, මත්තල



කුඹුරක් වටා ඉදිකෙරුණු කාලීන විදුලි වැටක කොටස් ගොවි මහතුන් විසින් ඉවත්කරන අවස්ථාවක් - පලුජඳුර, හම්බන්තොට




කුඹුරක් වටා ඉදිකෙරුණු කාලීන විදුලි වැටක කොටස් ගලවා ඉවත්කර ඊළඟ කන්නය ආරම්භය තෙක් ආරක්ෂිතව ගබඩා කිරීම රැගෙන යන අවස්ථාවක්

සියලු දෙනා අස්වනු නෙළන තුරු යාය තුළ අස්වනු ගොඩගසා තබා නියමිත දිනයේ දී පමණක් වැට ගළවා අස්වනු ඉවත් කර ගැනීම වඩාත් යෝග්‍ය ය.

## විදුලි වැට පසුවිපරම

විදුලි වැට ස්ථාපිත කළ පසු සතියකට වරක් එය වටා ඇවිද එය පරීක්ෂා කළ යුතුය. මේ සඳහා අවශ්‍ය ආයතනික සැලසුම් සකසා ගත යුතු අතර, ඒ හැම අවස්ථාවක් සඳහා ම ගොවි මහතකු ද සහභාගි විය යුතුය. විදුලි වැට පරීක්ෂා කිරීමේ දී එහි වෝල්ටීයතාවය, විදුලිය කාන්දුවීම් සහ වැට කණු ඇදවීම් ආදිය කෙරේ විශේෂ අවධානය යොමු විය යුතුය. යම් වරදක් ඇත්නම් එය ගොවි මහතාට පෙන්වූ පසු ඔහු ඒ බව විදුලි වැට කමිටුවට දන්වා ඔවුන් එය නිවැරදි කළ යුතුය.

කන්නය අවසානයේ වැට ඉවත් කරන අවස්ථාවේ දී එනජයිසරය වැට සමිතියෙන් භාර ගෙන ඊළඟ කන්නයේ වැට ස්ථාපිත කරන විට ලබා දීම වඩා සුදුසු ය.

වන අලින්ගෙන් දිගු කලක් පීඩා විඳිමින් ගොවීන් ජීවිතයත් මරණයත් අතර සටනක නියැළුණු යුගය අවසන් කර දැමීම සාර්ථකත්වය වෙත ළඟා වී ඇත. ඔබගේ මග පෙන්වීම හා ගොවීන්ගේ වෙහෙස මහන්සියෙන් කුඹුරු යාය වන අලින්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ඉදිකරන ලද කාලීන කුඹුරු විදුලි වැට මින් පසු යායට ආරක්ෂාව සලසා දෙනු ඇත. එමගින් ඔබ ශ්‍රී ලාංකික ජනතාවට සහ අලි-ඇතුන්ට මහඟු සේවයක් සිදු කිරීමේ ගෞරවය හිමි කර ගනු ඇත.

# වන අලින්ගෙන් කුඹුරු රැකදෙන ආරක්ෂිත විදුලි වැටක්

ශ්‍රී ලංකාව තුළ පරිසර සංරක්ෂණය සඳහා ප්‍රධාන බාධාවක් වී ඇත්තේ කළමනාකරණ සැලසුම් සකස්කිරීම සඳහා අවශ්‍ය පරිසර සංරක්ෂණය හා කළමනාකරණය සම්බන්ධ තොරතුරු හිඟයයි. දැනට දිවයිනේ අලි-මිනිස් ගැටුම් කළමනාකරණය හා වන අලි සංරක්ෂණ සඳහාද බාධාවක්ව පවතින එම තොරතුරු හිඟය පියවීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයන් ඔස්සේ පර්යේෂණ සිදු කිරීමටත් ප්‍රායෝගික විසඳුම් යෝජනා ඉදිරිපත් කිරීමටත් කැපවී සිටින ප්‍රමුඛ පෙළේ ශ්‍රී ලාංකේය ආයතනයක් ලෙස සංරක්ෂණ පර්යේෂණ ආයතනය (CCR) හැඳින්විය හැකිය. 2004 වසරේ සිට සංරක්ෂණ පර්යේෂණ ආයතනය (CCR) ශ්‍රී ලංකාවේ වන අලි ඇතුන් හා එම සතුන් දිවි ගෙවන වාසභූමි ආශ්‍රිතව ජීවත්වන ජනතාවගේ ජීවිත වඩාත් සුරක්ෂිත කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කරමින් සිටී. අලි ඇතුන් සංරක්ෂණය හා කළමනාකරණය කිරීමට සපලදායක ප්‍රවේශයන් විමසා බැලීම මෙන්ම ප්‍රජාව පදනම් කරගත් අලි-මිනිස් ගැටුම් අවම කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය යොමුවකට මග පෑදීම සංරක්ෂණ පර්යේෂණ ආයතනයේ (CCR) අරමුණයි.

**සංරක්ෂණ පර්යේෂණ ආයතනය**
Centre for Conservation and Research (CCR)

WFN WHITLEY FUND FOR NATURE

Abraham Foundation

CCR